www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මොහොමඩ් අබ්බාස් සහ පලස්තීන ජාතික ව්‍යාපාරයේ පිරිහීම

## Mahmoud Abbas and the degeneration of the Palestinian national movement

**පලමු කොටස**

**ජීන් ෂෝල් හා ක්‍රිස් මාස්ඩන් විසිනි**
**2005 පෙබරවාරි 16**

මොහොමඩ් අබ්බාස් පලස්තීන ජනාධිපති පදවියට පත් වී සති යන්තම් ගනනකට පසු ෂාම් එල් ෂෙයික් නම් ඊජිප්තු නිවාඩු නිකේතනයේ දී ඔහු සහ ඊස්රායල් අගමැති ඒරියල් ෂැරොන් අතර සටන් විරාමය නිවේදනය කෙරුනි. වොෂින්ටනයේ සහ ටෙල් අවිව් හි බලපෑම්වලට එරෙහි කිසිදු විරෝධතාවක් දැක්වීම පාලක ෆටා කන්ඩායම සහ පලස්තීන අධිකාරිය විසින් අතහැර දමනු ලැබීම අබ්බාස් බලයට පත් වීම සමග කෙතරම් තදින් බැඳී ඇත්ද යන්න එමගින් පෙන්නුම් කෙරේ.

ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ්ගෙ ''මාර්ග සිතියම '' ක්‍රියාත්මක කිරීමේ සහ ආනුෂංගිකව සිදුවන පලස්තීන රාජ්‍යය පිහිටුවීම ආරම්භයක් ලෙසට සටන් විරාමය ප්‍රසිද්ධ කලේ ය. නමුත් කිසියම් වූ පලස්තීන රාජ්‍යයක ''අවසන් තත්වය'' සම්බන්ධව සාකච්ඡා ඇරඹීමක් සම්බන්ධව එකඟතාවක් නො වී ය. නැගෙනහිර ජෙරුසලමේ විසඳීමට දුෂ්කර ප්‍රශ්න ගැන සහ පලස්තීන සරනාගතයින්ගේ නැවත පැමිනීමේ අයිතිය සම්බන්ධයෙන් එපමනවත් එකඟතාවක් නො වී ය.

සියලුම හමුදා ක්‍රියාමාර්ග නතර කිරීමටත්, බටහිර ඉවුරේ හා ගාසා තීරයේ ආරක්ෂාව පාලනය කිරීම පලස්තීන අධිකාරිය වෙත පැවරීමටත්, එලඹෙන මාස තුන ඇතුලත ඊස්රායල් සිර කඳවුරුවල රඳවා සිටින සිරකරුවන් 900 දෙනෙක් නිදහස් කිරීමට සහ ''විශ්වාසය තහවුරු කිරීමේ'' වෙනත් පියවරයන් ක්‍රියාවේ යෙදවීමට ධවල මන්දිරයේ පීඩනය යටතේ ෂැරොන් එකඟ විය. ගාසා තීරයේ පදිංචිකරුවන් සහ බටහිර ඉවුරේ පිටත පිහිටුවා ඇති මුරපලවල් හතර ඉවත් කිරීමේ ''මුදවාලීමේ සැලැස්ම'' අවසන් වනතුරු, තවත් සහන සපයන ලෙසට ඊස්රායලයට බලකිරීමට වොෂින්ටනය බලාපොරොත්තු නොවන බව, එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් පැවසී ය. ඇත්ත වශයෙන් ම, වෙනත් ඉදිරි ක්‍රියාමාර්ග රඳා පවතින්නේ, අබ්බාස්, ඊස්රායලයට එරෙහි සියලු ම සන්නද්ධ ප්‍රතිවිරෝධයන් මර්දනය කිරීම, සටන්කාමී ඉස්ලාම් කන්ඩායම් පාලනය කිරීම හා විවිධ වූ ආරක්ෂක සේවා ඔහු යටතේ මධ්‍යගත කිරීම් මත ය. පලස්තීන ආරක්ෂක හමුදා ප්‍රතිසංස්කරනය කිරීම අධීක්ෂනය කිරීමට එක්සත් ජනපද හිටපු ජෙනරාල්වරයෙක් පත් කරන බව රයිස් තවදුරටත් පැවසුවා ය.

ඊස්රායලය සතුටු කරන්නට අබ්බාස් දැනටමත් මහත් පරිශ්‍රමයක් දරා ඇත. ජනවාරි 9 දා බලයට පැමිනීමේ පටන්, ඊස්රායලයට එරෙහි බෝම්බ ප්‍රහාර අවසන් කිරීමට හමාස්, ඉස්ලාමීය ජිහාඩ් සහ අල් අක්සා මාර්ටියර්ස් බ්‍රිගේඩය පොලඹවා ගැනීමට ඔහු උත්සාහ කර ඇත. මෑත කාලයේ ගාසා සහ බටහිර ඉවුරේ පැවැත්වූ ප්‍රාදේශීය මැතිවරනවලින් එය ලද ජයග්‍රහනයන් පසුව, පලස්තීන ව්‍යවස්ථාදායක සභාවේ දේශපාලන නියෝජනය හමාස් වෙත ප්‍රදානය කිරීමට එකඟවෙමින් දේශපාලන බලය බෙදා ගැනීම කෙරෙහි බලාපොරොත්තු හමාස් කන්ඩායම තුල ඇති කර තිබේ. ඒ සමගම, ඊස්රායල් ඉලක්ක වෙත කෙරෙන රොකට් ප්‍රහාර වැලැක්වීමටත් මරාගෙන මැරෙන බෝම්බකරුවන් සිරභාරයට ගැනීමටත් 8,000 පොලිස් බල ඇනියක් ගාසා වෙත පිටත්කර යවා ඇත. බටහිර ඉවුරේ සහ ගාසා තීරයේ පැවැත් වූ ප්‍රාදේශීය මැතිවරනවල දී එය ලද ජයග්‍රහනවලින් පසුව, ජූලි මාසයේ මැතිවරන පැවත්වීමට පලස්තීන විමුක්ති සංවිධානයේ දිගුකාලීන නායක යසර් අරපත් විසින් වලකන ලද තමන්ගේ ම ජනතාවට විරුද්ධව කරගෙන යනු ලබන කාර්යයන් හරහා වොෂින්ටනයේ උපකාරය වගාදිගා කරගන්නට අබ්බාස් උත්සාහ කල ද ඔහුගේ වර්තමාන ක්‍රියා කලාපය සමස්තයක් ලෙස පලස්තීන ජාතික ව්‍යාපාරයේ පිරිහීම පෙන්නුම් කරයි. - පීඑල්ඕව තුලම මුල්බැසගත් ධනේශ්වර ස්භාවයේ පරිහානියත්, පලස්තීන රාජ්‍යය පිහිටුවීම සඳහා වූ පීඑල්ඕවේ මූලික ඉදිරිදර්ශන හැමවිට ම අධිරාජ්‍යවාදය සමග සම්මුති ඇති කර ගැනීම මත පදනම් කෙරුනි. සාකච්ඡා සහ සන්නද්ධ අරගලය යන විධික්‍රම දෙකක් ඔස්සේ මෙම අරමුන හඹා ගොස් ඇත.

එකිනෙකට විරුද්ධ ක්‍රියාමාර්ග ලෙස දිස් වුවද, ඒවා සැම විටම විය යුතු ලෙසට ම ඌනපූරක වූහ. සන්නද්ධ

අරගලයේ අවසාන අරමුන වූයේ, කම්කරු පන්තිය සහ ගොවි ජනතාව ස්වාධීනව මෙහෙයවා ගැනීම නොව, අධිරාජ්‍යවාදය සමග සම්මුතිගත විසඳුමකි. වෙනත් වචනවලින් පවසනවා නම්, අබ්බාස් සහ පීඑල්ඕ නායකත්වය විසින් සටන් විරාමය පිලිගැනීම සහ එය ක්‍රියාවේ යෙදවීම සන්නද්ධ අරගලයේ තර්කනය සමග නොවේඃ එය තුලින්ම ඓන්ද්‍රියව පැන නැංගකි.

ඊස්රායලයට විරුද්ධව සන්නද්ධ අරගලය කෙරෙහි අධිෂ්ඨානශීලී කැපවීම නිසා, පීඑල්ඕව, පලස්තීන ජනතාවගේ පලල් කොටස් අතර මහජන පදනමක් ගොඩනගාගත් වඩාත් ම රැඩිකල් ජනතා ව්‍යාපාරය විය. නමුත් සාරයෙන් එහි නායකත්වය නියෝජනය කලේ ඔවුන් දේශනා කල ආකාරයට එකී මහ ජනයා නොව, පලස්තීන ධනේශ්වරයේ හා එහි අවශ්‍යතා යි. අවසන් විග්‍රහයේ දී, ඔවුන්ගේ අවශ්‍යතාවන් අභ්‍යන්තරයෙන් ම කම්කරු පන්තියට සහ ගොවි ජනතාවට විරුද්ධ නිසා, ජාතික ධනේශ්වර සංවිධාන කොයි තරම් රැඩිකල් වුවත්, ඒවාට ප්‍රගතිශීලී සහ ප්‍රජාතාන්ත්‍රික මාවතේ අධිරාජ්‍යයට විරුද්ධව නො නවතින ස්වාධීන අරගලයකට නායකත්වය සැපයීමේ ඓන්ද්‍රීය නොහැකියාවක් පවතී. ජාතික භූමි ප්‍රදේශයක් පිහිටුවීම 1948 කොල්ලකන ලද දේශය යලි අත් පත් කර ගැනීමත් සහ අධිරාජ්‍යවාදී සහ සියොන්වාදී පීඩනයෙන් අත් මිදී ගැනීමේ දෘෂ්ටි ආස්ථානයෙන් කම්කරු පන්තිය සහ ගොවි ජනතාව දුටු නමුත් ඊස්රායලය සමග එහි ගැටුම තුල පලස්තීන ධනේශ්වරයේ නිරවශේෂ අරමුන වූයේ කම්කරු පන්තිය සූරාකෑමේ තමන්ගේම පන්ති පාලනය තහවුරු කිරීම ය. එබැවින් අධිරාජ්‍යවාදයට එරෙහි ඔවුන්ගේ විරෝධය සෑම විටම කොන්දේසි සහිත ද පාර්ශ්වීය ද වෙයි. එහි අරමුන අධිරාජ්‍යවාදී අධිකාරය අවසන් කිරීම නොව භූගෝලීය ආර්ථිකයේ අධිකාරය දරන ප්‍රධාන අධිරාජ්‍යවාදී බලයන් සමග තමාගේම සම්බන්ධතා ගොඩ නගා ගැනීම යි. සියලු අවස්ථාවල දී, අධිරාජ්‍යවාදී පාලනයට තර්ජනයක් වන කම්කරු පන්තියේ මොනයම් හෝ ස්වාධීන ක්‍රියාමාර්ගයකට එය විරෝධය පායි. එසේ හෙයින්, එහි ඉතා රැඩිකල් කාල පරිච්ඡේදයේ දී පවා, තමන් ''පලස්තීන ජනතාවගේ එකම නීත්‍යානුකූල නියෝජිතයා'' ලෙස පිලිගන්නා ලෙසට පීඑල්ඕව අවධාරනය කල අතර එහි ඉදිරිදර්ශනය වූයේ අධිරාජ්‍යවාදී දේපොල සම්බන්ධතාවලට අභියෝග නො කරන්නා වූ පදනමක පලස්තීන රාජ්‍යය ගොඩ නැගීම යි.

මෙම පදනම මත ජාතික පීඩනය හා සමාජ සූරාකෑම වැනි ප්‍රශ්න කිසි සේත්ම විසඳීමට නොහැකි විය. මැද පෙරදිග කිසිදු රටකට, ජාතික විප්ලවවාදී බලවේග විසින් යටත් විජිත පාලනය බිඳ දමා තෙල් සම්පත් අයිති කර ගත් රටවලට පවා අන්තර්ජාතික බැංකු සහ සමාගම්වල අධිකාරය අහෝසි කිරීමට හෝ කම්කරු පන්තියේ හා ගැමි දුප්පතුන් දුක්ඛිත සමාජ තත්වයන්ගෙන් ගලවා ලන්නට නොහැකි විය. ඒ වෙනුවට ඔවුහු ඔවුන්ගේ යටත් විජිත පාලකයන් හෝ රූකඩ රජුන් වෙනුවට දේශීය ධනේශ්වර කල්ලි හුවමාරු කලහ. මෙම කටයුත්තේ දී පීඑල්ඕවද ඊට වඩා වෙනස් නොවන බව සනාථ කරනු ලබමින් සිටී.

පලස්තීන ජනතාව පීඩාවට පත්වීම, අරාබි ධනේශ්වරයේ ද්‍රෝහිත්වය නිසා මිස හුදෙක් හුදෙක් ඊස්රායෙල් යුද බලයේ ප්‍රතිඵලයක් නොවේ. පලස්තීන රාජ්‍යය ලබා ගැනීම සඳහා විවිධ අරාබි රාජ්‍ය හරහා සිය උපාය මාර්ග යෙදවීමේ සෘජු ප්‍රතිඵලයක් ලෙසට, අරෆත් සහ පීඑල්ඕව, ඔවුන්ගෙන් සහ ඔවුන්ගේ අධිරාජ්‍යවාදී අනුබල දෙන්නන් ගෙන් කිසිදු ස්වාධීනත්වයක් කවදාවත් අත් කරගන්නට අසමත් වූහ.

සෝවියට් දේශයේ ස්ටැලින්වාදී රාජ්‍යයේ ආධාර මත අරෆත් තැබූ විශ්වාසය තව දුරටත් සාර්ථක නො වී ය. මැද පෙරදිග ආධිපත්‍යය සඳහා මොස්කව් හා වොෂින්ටනය අතර අරගලය පැවති අවධියේ විවිධ අරාබි ධනේශ්වර රාජ්‍යයන්ට කේවෙල් කිරීමේ යම්කිසි බලයක් තිබුනි. අධිරාජ්‍යවාදී බලවේග සමග අප්‍රතිපත්තික උපාමාරු දැමීමේ නියෝගයන් සහ කවර වියදමකින් හෝ සමාජ විප්ලවය මැඩ පැවැත්වීමේ ඔවුන්ගේ ම උත්සාහයන් නිසා මෙම කේවල් කිරීම් සීමා කරනු ලැබිනි. ගොර්බචෙව් සහ යෙල්ට්සින් යටතේ ධනවාදය පුනස්ථාපනය කිරීමේ ස්ටැලින්වාදී ප්‍රයත්නයන් නිසා අවසානයේ දී සෝවියට් දේශය බිඳ වැටීම විසින් එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සමග එකඟතාවකට ඒමට අරෆත්ට බල කෙරුනි. එම තීරනාත්මක සාකච්ඡාවල දී ඔහු සමග සිටියේ අබ්බාස් ය.

## මොහොමඩ් අබ්බාස් යනු කවුද?

පලස්තීන ධනේශ්වරයේ අවශ්‍යතා ඔහු විසින් නිරතුරුව නියෝජනය කිරීම අබ්බාස් බලයට පත් වීමට තුඩු දී ඇත. දැනට උතුරු ඊස්රායලයට අයත් සෆේඩ්හි දී, 1935 දී, ඉතා සමෘධිමත් වෙලඳ පවුලක ඔහු උපත ලැබී ය. එවකට එක්සත් ජාතීන්ගේ නියෝගයකට අනුව බ්‍රිතාන්‍යය විසින් පාලනය කරන ලද, පලස්තීනයේ කොටසක සියොන්වාදී රාජ්‍යය ස්ථාපිත කිරීමට එක්සත් ජාතීන් සිය ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසු 1948 අරාබි-ඊස්රායල් යුද්ධය හට ගැනීමත් සමග පලස්තීනයෙන් පලා ගිය හෝ පන්නා දැමුනු 750,000 පවුල් අතර ඔවුහු ද වූහ. ඔහුගේ වරප්‍රසාදිත සමාජ තත්වය විසින් ඩැමස්කස් සරසවියේ නීතිය ඉගෙනීමට ඉඩකඩ ලැබුනි. අනතුරුව තමන්ගේ ම ව්‍යාපාරයක් ඇරඹීමට ප්‍රථම, කටාර්හි සිවිල් සේවයේ යෙදීමට ඔහුට අවසර ලැබින.

එම කාලයේදී ගල්ෆ්හි පලස්තීන වෘත්තිකයන් දහස් ගනනක් සේවය කල අතර පීඑල්ඕවේ අරටුව බවට පත්වූ අර්ෆත් අල්ෆටා හෙවත් පලස්තීන ජාතික විමුක්ති

ව්‍යාපාර සමග සම්බන්ධකම් ගොඩනගා ගත්තේ ය. පලස්තීන ධනේශ්වර ජාතික ව්‍යාපාරයේ වඩාත්ම ර ඩිකල් කොටස අල්ෆාටා නියෝජනය කලේ ය. එහි ප්‍රකාශිත අරමුන වූයේ, ඊශ්‍රායලය විසින් අත් පත් කර ගන්නා ලද ප්‍රදේශ නැවත අත් පත් කර ගැනීමත් ප්‍රජාතන්ත්‍රවාදී අනාගමික පලස්තීනයක් සන්නද්ධ අරගලයන් තුලින් දිනා ගැනීම ය.

මෙය කම්කරු පන්තිය සහ ගොවි ජනතාව අතරේ ජනප්‍රියත්වයක් ආකර්ශනය කරගැනීමට හේතු විය. නමුත් එය හැම විටම ධනවාදී පලස්තීන රාජ්‍යයකට පක්ෂව සමාජවාදී ඉදිරි දර්ශනයකට විරුද්ධ විය. මෙම පන්ති පැවැත්ම නිසා, අබ්බාස් වැනි බොහෝ වරප්‍රසාදිත කොටස්වල සහයෝගය ලබා ගැනීමට ෆාටා සංවිධානයට හැකි විය.

අබ්බාස් ෆාටා සඳහා වැදගත් අරමුදල් රැස් කරන්නෙක් විය. ඒ සමගම, අරාබි රාජ්‍යයන් සමග සබඳතා ගොඩනගා ගැනීමේ වගකීම ද ඔහු සතු විය. අරාබි නායකයන් සහ රහස් ඔත්තු සේවා ප්‍රධානීන් සමග බලගතු සබඳතා ජාලයක් ඔහු ගොඩ නැගුවේ ය. පීඑල්ඕව අරාබි රාජ්‍යයන්ගේ නීත්‍යානුකුල භාවය පිලිගත් නිසාත් අරාබි මහ ජනතාව ඒකාධිපතිත්වයට සහ ඔවුන් පාලනය කල අර්ධ-වැඩවසම් රජපැලැන්තියට එරෙහි සටන පලස්තීන අරගලයෙන් වෙන් කිරීමට එකඟ වීම නිසාත් අබ්බාස්ට මෙය පහසු කටයුත්තක් විය. අබ්බාස් පීඑල්ඕවේ මූල්‍ය කටයුතු කලමනාකරනයට පත් වුනත්, ඔහු ෆාටාහි දක්ෂිනාංශික කන්ඩායමේ සාමාජිකයෙක් වූ අතර, එවකට අරෆාත්, අබු ජිහාඩ්, සහ අබු අයියාම් විසින් නායකත්වය සපයන ලද පීඑල්ඕවේ අභ්‍යන්තර කවයේ සාමාජිකයෙක් නොවූයේ ය. ඔහුට අරෆාත් සමග තිබුනේ කලහකාරී සම්බන්ධතාවයකි. මොවුන් දෙදෙනා එකිනෙකාට කතා කිරීම ප්‍රතික්ෂේප කල අවස්ථා ගනනනාවක් විය. පීඑල්ඕවේ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වලින් දුරස්තව සිටියේ ය. කලු සැප්තැම්බරය නමින් ප්‍රසිද්ධ 1970 දී ජෝර්දානයේ හුසේන් රජු විසින් රට තුල සිටි පලස්තීනුවන් රුදුරු ලෙස මර්දනය කර පීඑල්ඕව රටින් නෙරපා ලෙබනනය තුලට ඔවුහු බලාත්කාරයෙන් තල්ලු කිරීමෙන් පසු ඔහු සිරියාවේ වාසය කලේ ය.

ඊශ්‍රායලය පිලිගන්නා ලද පලමුවෙනි පීඑල්ඕ නිලධාරියා, අබ්බාස් විය. ඊනියා රාජ්‍ය දෙකේ විසඳුම වන ඊශ්‍රායලය පසෙකින් කුඩා පලස්තීනයක් පිහිටුවීම පිලිගත් පලමු නිලධාරීන් අතර ඔහු සිටියේ ය. 1970 අග භාගයේ දී ඔහු පලස්තීනුවන් සහ ඊශ්‍රායල් සාම කන්ඩායම් අතර සම්බන්ධතා ගොඩනැගීමට උපකාරක විය. 1980 සිට ඔහු ජාතික සහ අන්තර්ජාතික සම්බන්ධතා පිලිබඳ පීඑල්ඕ කමිටුවේ මුලසුන හෙබවී ය.

ඔහු සහ පලස්තීන අගමැති අහමඩ් කුරි අරෆාත්ට වඩා සමීප වූයේ 1988 දී ය. එම වසරේදී අබ්බාස් පීඑල්ඕ විධායකයෙකු ලෙස තේරී පත් විය. පීඑල්ඕවේ රැඩිකල් නායකයන්ව ඝාතනය කිරීම ඉලක්ක කොටගත් ඊශ්‍රායලයේ ප්‍රතිපත්තිය ඔහුගේ ප්‍රමුඛත්වයට පැමිනීමට පාර්ශ්විකව බලපෑවේ ය. 1988 දී අබු අයියාඩ් හා අබු ජිහාඩ් ඊශ්‍රායල් ආරක්ෂක හමුදා විසින් ඝාතනය කරනු ලැබීම, අබ්බාස් සහ කුරි විසින් නියෝජනය කරන ලද ෆාටාහි දක්ෂිනාංශය බලයට පත් කිරීමට වේදිකාව නිර්මානය කලේ ය.

වඩා මූලිකවම, පීඑල්ඕව වොෂින්ටනයේ දෑත් තුලට තල්ලු කල ප්‍රධාන දේශපාලනික වෙනස් වීම් දෙකක වාසි ලද්දෙක් බවට අබ්බාස් පත්විය.

පලමුව, ස්ටැලින්වාදී නිලධරය සෝවියට් දේශය කැබලිවලට කඩා බිඳ දැමීම සහ එක්සත් ජනපදය දෙසට එහි විදේශ ප්‍රතිපත්තියේ නැම්යාවක් ඇති වීම පීඑල්ඕවට පෙර දී මෙන්, අධිරාජ්‍යවාදී බලයන් අතර උපාමාරු දැමීම සඳහා වූ ඉඩකඩ පටු විය. සෝවියට් දේශයේ කඩා වැටීම, සිය රාජ්‍ය බලය භූගෝලීයව ස්ථාපිත කිරීමට එක්සත් ජනපදයට පෙර නොවූ විරූ අවස්ථාවක් උදා කලේ ය. මැද පෙරදිග, ඉරාකයට එරෙහිව 1991 ගල්ෆ් යුද්ධය ආරම්භ කිරීමට ජෝර්ජ් බුෂ් ට ඉඩකඩ සැලැස්වීය. පීඑල්ඕව, ඊශ්‍රායලයට හා එක්සත් ජනපදයට විරෝධය පාමින් සදාම් හුසේන්ට සහාය දීම මගින් ඊශ්‍රායලයට සහ එක්සත් ජනපදය යන දෙකට ම විරුද්ධ වීමට අවසාන උත්සාහය ව්‍යවර්ත කරමින් පීඑල්ඕව මුලුමනින් ම හුදකලා විය.

දෙවනුව, ඊශ්‍රායල් අල්ලාගැනීම්වලට එරෙහිව 1987 දෙසැම්බර් මාසයේ දී පැන නැගි පලස්තීන කම්කරුවන්ගේ සහ තරුනයන්ගේ ස්වයංසිද්ධ ව්‍යාපාරයක් වූ ඉන්ටිෆාඩාව මහජනතාවගේ විප්ලවවාදී ව්‍යාපාරය පලස්තීනයේ දී සහ තෙල්වලින් පොහොසත් මැද පෙරදිග දී පාලනයකින් තොරව ඉදිරියට යතැයි වොෂින්ටනය හා ඊශ්‍රායල් රාජ්‍යය පමනක් නොව පලස්තීන ධනේශ්වරය ද තැති ගත්තේ ය. අබ්බාස් පිලිබිඹු කෙරුනු උත්සුකතා සහිතව පිටුවාහලේ පසුවුන පලස්තීන ධනපතීන් මෙම තත්වය සිය ආර්ථික හා සමාජීය අභිලාෂයන්ට ප්‍රධාන අනතුරක් ලෙස දුටුවේ ය.

පලස්තීන තරුන මිලිටරි කන්ඩායම් හා කම්කරුවන් සමග ගැටුන පලස්තීන ධනේශ්වරය යම් දිනක තමන්ගේ පාලනයක් ස්ථාපිත කිරීමට නම්, තමන් හට ඇමරිකන් අධිරාජ්‍යවාදයේ සහයෝගය අවශ්‍ය බව නිගමනය කලේ ය. ධවල මන්දිර තන නිල්ලේ දී සිය සන්නද්ධ අරගලය ප්‍රතික්ෂේප කරන්නට අලුතෙන් යලි ස්ථාපිත කෙරුනු පීඑල්ඕ නායකත්වය මෙහෙයවුනේ මෙම සාධකයන් මගිනි. මැද පෙරදිග මූලික පන්තිමය ප්‍රශ්න විසඳාගැනීමකින් තොරව එයට පලස්තීන ප්‍රශ්නය විසඳා ගත හැකිය යන පීඑල්ඕව මහා විනාශය සමග සිය අවසානය සටහන් කෙලේ ය.

දෙවනුව ඊස්රායල් අල්ලාගැනීම්වලට එරෙහිව 1997 දෙසැම්බර් මාසයේ දී පැන නැගි පලස්තීන කම්කරුවන්ගේ සහ තරුනයන්ගේ ස්වයංසිද්ධ ව්‍යාපාරයක් වූ ඉන්ටිෆාඩාව මෙම වර්ධනයන් පීඑල්ඕව ඊස්රායලයට යටත් වීමේ කොන්දේසි පැනවීමට සහ කවර හෝ පලස්තීන රාජ්‍යයක අනාගත රූපාකාරය තීන්දු කිරීමට එක්සත් ජනපදයට ඉඩ සලසා දුනි.

1991 මැඩ්රිඩ් සමුලුවේ හා රහසිගත ඔස්ලෝ සමුලුවේ තීරනාත්මක කාර්යභාරයක් ඉටු කරමින් ස්වාධීන පලස්තීන රාජ්‍යය දෙසට පලමු අඩියර ලෙස, අවාසනාවන්ත ඉරනමකට ගොදුරු වූ, ඔස්ලෝ ගිවිසුම 1993 දී ඊස්රායල සමග අත්සන් කිරීම දක්වා අබ්බාස් පෙරට ගියේ ය.

**මතු සම්බන්ධයි**

© www.wsws.org